# 06 ශ්‍රේණිය - ගණිතය

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-03

## (2020- නව නිර්දේශය)




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


(විවිධ පළාත් සහ පාසල් මගින් තුන්වන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 05ක් සහ පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

# Grade 6 Maths 3rd term Online Paper No - 01

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම**

**6 ශ්‍රේණිය**

**ගණිතය**

කාලය : පැය 02

### I කොටස

**සැලකිය යුතුයි :**

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


01. සංඛ්‍යාවක එකස්ථානයේ ඉලක්කමකින් නිරූපණය කළ හැකි විශාල ම අගය, පහත පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.
(i) 10 (ii) 1 (iii)9 (iv)90

02. $25 \div 3$ සුළු කළ විට, (i) ලබ්ධිය කීයද?
(ii) ශේෂය කීයද?


03. පාසලක උදෑසන ව්‍යායාම කිරීම ආරම්භ කරන ලද්දේ පෙ.ව. 7.45ට වන අතර අවසන් කළේ පෙ.ව. 8.06ට ය. ළමුන් ව්‍යායාම කළ කාලය කොපමණද?

04. සංඛ්‍යාවක් ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට එම අගය 90 විය. ඒ සඳහා තිබිය හැකි කුඩා ම සංඛ්‍යාව කීයද?

05. රූපයේ දී ඇති දත්ත අනුව හිස්තැන් සම්පූර්ණ කරන්න.
සරල කෝණය .............. මගින් ද
මහා කෝණය .............. මගින් ද දැක්වේ.




06. සිරස් බිත්තියක ඇඳ ඇති රූප සටහනක් දක්වා ඇත. Aට තිරස්ව පිහිටි කොටුව තුළ X අක්ෂරය ද සිරස්ව පිහිටි කොටුව තුළ Y අක්ෂරය ද ලියන්න.




07. සුළු කරන්න. $\frac{1}{5} - \frac{1}{10}$

08. පහත දැක්වෙන සම්බන්ධතාවලින් නිවැරදි ඒවා ඉදිරියේ කොටුව තුළ හරි (✓) ලකුණ යොදන්න.
(a) -4 > -6 ☐ (c) 0 > -7 ☐
(b) 7 < -9 ☐ (d) -5 = 5 ☐


09. 2, 3, 4, 5, 6, 7, 8, 9 යන සංඛ්‍යා පොදු වූ ලක්ෂණයක් අනුව කාණ්ඩ දෙකකට වෙන්කර, රවුම තුළ ලියා වෙන් කළ ලක්ෂණය අනුව නාමයක් ද ලියන්න.



....................................... .......................................

10. 3 හා 4 යන සංඛ්‍යා දෙකෙහි ම ගුණාකාරයක් වන සංඛ්‍යා දෙකක් ලියන්න.

11. දී ඇති රූපයේ දැකිය හැකි චතුරස්‍ර වර්ග දෙකක් ලියන්න.



12. 50ත් 100ත් අතර ඇති සමචතුරස්‍ර සංඛ්‍යා සියල්ල ලියන්න.


13. බේසමක ජලය 3 $l$ තිබුණි. එහි ඇති සිදුරකින් මිනිත්තු 10ක් තුළ ජලය 150 m$l$ ක් ඉවත් විය. බේසමේ ඉතිරිව ඇති ජල ප්‍රමාණය කොපමණද?

14. චතුස්තලයක ඇති (i) මුහුණත් ගණන කීයද?
(ii) දාර ගණන කීයද?

15. 36 : 8 අනුපාතයට, තුල්‍ය සරල ම අනුපාතය ලියන්න.


16. (i) $2 \times 2 \times 3 \times 3 \times 3$ දර්ශක භාවිතයෙන් ලියන්න.
(ii) $2^3 \times 5^2$ අගය සොයන්න.

17. එක් කුඩා කොටුවක වර්ගඵලය 1 cm$^2$ නම් රූපයේ වර්ගඵලය කොපමණද?



18. $x = 4$ නම් පහත ප්‍රකාශනවල අගය සොයන්න.
(i) $15 + x$ (ii) $13 - x$

19. මෙම රූපයේ දැකිය හැකි වෘත්ත ගණන කීයද?



20. හිස්තැනට ගැළපෙන අගයන් ලියන්න.

| | kg | g | | |
|---|---|---|---|---|
| | 6 | 0 | 2 | 5 |
| - | □ | □ | □ | □ |
| | 3 | 7 | 7 | 5 |

## II කොටස

- ❖ **පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් පිළිතුරු සපයන්න.**
- ❖ **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද ලැබේ.**

01. ගණිත ගුරුතුමා හෝ ගුරුතුමියගේ මග පෙන්වීම යටතේ දිග මැනීම පාඩමේ දී ඔබ කළ ක්‍රියාකාරකම සිහිපත් කරන්න.
ළමයෙක් දිග මැනීමේ පාඩමේ දී ලබාගත් දත්ත පහත වගුවේ දැක්වේ.

| මිනුම් ලබාගත් දේ | මිනුම |
|---|---|
| ළමා මේසයේ දිග | 62 cm |
| ගුරු මේසයේ දිග | 1.05 m |
| පංති කාමරයේ දිග | 12 m 15 cm |
| පෑනක දිග | 13 cm 2 mm |

(i) පංති කාමරයේ දිග මැනීමට සුදුසු මිනුම් උපකරණය කුමක්ද?
(ii) මෙම පංති කාමරයේ දිග සෙන්ටි මීටරවලින් ලියන්න.
(iii) ගුරු මේසයේ දිග මීටර හා සෙන්ටි මීටරවලින් ලියන්න.
(iv) පෑනේ දිග මිලිමීටර්වලින් කොපමණද?
(v) ළමා මේසයේ හා ගුරු මේසයේ දිගවල එකතුව කියද?
(vi) පෑනට වඩා ළමා මේසයක දිග කොපමණ වැඩි ද?
(vii) පංති කාමරයේ පළල 6 m 90 cm නම් එම පංති කාමරයේ පරිමිතිය සොයන්න.
(viii) ළමා මේස 5ක් එක පේළියට ගැළෙන සේ තැබූ විට එහි දිග සොයන්න.

02. (a) (i) 1 හා 42 යන්න 42 හි සාධක දෙකකි. 42 හි වෙනත් සාධක තුනක් ලියන්න.
(ii) පැන්සලක මිල රු. 12.00ක් නම් පැන්සල් 12ක මිල කියද?
(iii) 345☐ යනු ඉලක්කම් හතරකින් යුත් සංඛ්‍යාවකි. මෙම සංඛ්‍යාව ඉතිරි නැතුව 5න් බෙදේ නම්, හිස් කොටුව තුළ තිබිය හැකි සියලු සංඛ්‍යා ලියන්න.

(b) අගය සොයන්න.

(i)
```
   13 . 65
 + 3  . 98
 _________
 =========
```

(ii)
```
   70 . 01
  -19 . 99
 _________
 =========
```

03. (a) (i) "ඉරට්ට සංඛ්‍යාවක් + ඉරට්ට සංඛ්‍යාවක්" මගින් සෑම විට ම ලැබෙන්නේ කවර වර්ගයේ සංඛ්‍යාවක් ද?
(ii) "ඔත්තේ සංඛ්‍යාවක් × ඔත්තේ සංඛ්‍යාවක්" මගින් සෑම විට ම ලැබෙන්නේ කවර වර්ගයේ සංඛ්‍යාවක් ද?
(iii) 9 හා 18 අතර ඇති ත්‍රිකෝණ සංඛ්‍යා සියල්ල ලියන්න.
(iv) ප්‍රථමක සංඛ්‍යාවක් වන ඉරට්ටේ සංඛ්‍යාව කුමක්ද?
(v) 0, 1, 2, 4 යන ඉලක්කම් හතර ම භාවිතයෙන් ලිවිය හැකි විශාල ම ඔත්තේ සංඛ්‍යාව කුමක්ද?

(b) පේර ගෙඩියක මිල රු. $x$ ද අඹ ගෙඩියක මිල රු. 40ක් ද වේ.
(i) පේර ගෙඩියක් හා අඹ ගෙඩියක් මිල දී ගැනීමට වැය වන මුදල සඳහා වීජිය ප්‍රකාශනයක් $x$ ඇසුරෙන් ලියන්න.
(ii) පේර ගෙඩියක් රු. 15ක් නම් ඉහත වීජිය ප්‍රකාශනයේ අගය සොයන්න.

04. සිරිපාල මුදලාලිගේ වෙළඳ සැලෙහි සතියේ දිනවල විකුණන ලද පොල් ගෙඩි පිළිබඳ විස්තරයක් පහත චිත්‍ර ප්‍රස්තාරයේ දැක්වේ.

| | |
|---|---|
| සඳුදා | ● ● ● ● ● ● |
| අඟහරුවාදා | ● ● ● ◖ |
| බදාදා | ● ● ● ● |
| බ්‍රහස්පතින්දා | ● ● ● ● ◖ |
| සිකුරාදා | ● ● ● ● |
| සෙනසුරාදා | |
| ඉරිදා | |


● පොල් ගෙඩි 10ක් නිරූපණය වේ.

(i) වැඩි ම පොල් ගෙඩි ගණනක් විකුණා ඇත්තේ ඉහත ප්‍රස්තාරය අනුව කවදාද?
(ii) බදාදා විකුණු පොල් ගෙඩි ගණන කීයද?
(iii) සමාන පොල් ගෙඩි ප්‍රමාණයන් විකුණා ඇත්තේ කවර දිනවල ද?
(iv) සෙනසුරාදා පොල් ගෙඩි 20ක් ද ඉරිදා පොල් ගෙඩි 15ක් ද විකුණුවේ නම් එම තොරතුරු ප්‍රස්තාරයේ දක්වන්න.
(v) සතියේ දින 7 තුළ විකුණා ඇති මුළු පොල් ගෙඩි ගණන කීයද?
(vi) පොල් ගෙඩියක මිල රු. 60ක් නම් සතිය තුළ පොල් විකුණා ලැබූ මුළු මුදල කීයද?

05. කොටුව තුළ ඇති භාග, දශම සංඛ්‍යා අතරින්
(i) ඒකක භාගයක් ලියන්න.
(ii) 0.5 භාගයක් ලෙස ලියන්න.
(iii) $\frac{2}{5}$ ට තුල්‍ය භාගයක් තෝරා ලියන්න.
(iv) $\frac{5}{10}$ , දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.
(v) කොටුව තුළ ඇති දශම සංඛ්‍යා ">" යන සංකේතය යොදා සම්බන්ධ කරන්න.
(vi) $\frac{1}{12}+\frac{1}{6}+\frac{1}{3}$ අගය සොයන්න.


| | | |
|---|---|---|
| $\frac{1}{2}$ | $\frac{3}{8}$ | $\frac{2}{5}$ |
| $\frac{1}{4}$ | $\frac{13}{7}$ | 0.03 |
| 0.5 | 4 | $\frac{4}{10}$ |
| $\frac{5}{8}$ | $\frac{3}{8}$ | 1.5 |

06. (a) එක්තරා පාසලක ප්‍රධාන ස්ථාන කිපයක් පිහිටා ඇති ආකාරය පහත දැක්වේ. එම පිහිටීම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ගේට්ටුව පිහිටා ඇත්තේ බුදුමැදුරට කුමන දිශාවෙන් ද?
(ii) ප්‍රධාන ශාලාවට බස්නාහිරින් පිහිටා ඇත්තේ කුමක්ද?
(iii) ළිඳ පිහිටා ඇත්තේ පුස්තකාලයට කුමන දිශාවෙන් ද?
(iv) ළමයෙක් පිට්ටනියේ සිට විද්‍යාගාරය දෙස බලා සිටියි. ඔහුගේ වම් අත පිහිටන්නේ කුමන දිශාවට ද?

(b)




සංඛ්‍යා රේඛාවේ
(i) P මගින් නිරූපණය වන අගය ලියන්න.
(ii) Q මගින් නිරූපණය වන අගය ලියන්න.
(iii) P හා Q හි සංඛ්‍යා දෙක ">" යොදා සම්බන්ධ කරන්න.

07. (i) 6533172 සංඛ්‍යාව කලාපවලට වෙන්කර ලියන්න.
(ii) මෙම සංඛ්‍යාව කියවන ආකාරයෙන් ලියන්න.
(iii) ඉහත සංඛ්‍යාවේ 1න් නිරූපණය වන ස්ථානීය අගය කීයද?
(iv) 1.23 ගණක රාමුවක ඇඳ නිරූපණය කරන්න.
(v) $4^3$ හා $3^4$ අතරින් වඩා විශාල සංඛ්‍යාව කුමක්ද?

# Grade 6 Maths 3rd term Online Paper No - 01

No 01

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 06 | විෂයය / பாடம் / Subject ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | පිළිතුරු පත්‍රය |

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| 01. | (iii) 9 | 2 |
| 02. | ලබ්ධිය 8 | 1 |
| | ශේෂය 1 | 1 |
| 03. | මිනිත්තු 21 | 2 |
| | (ඒකකය නොමැති නම්) | 1 |
| 04. | 85 | 2 |
| 05. | (i) සරල කෝණය = d | 1 |
| | (ii) මහා කෝණය = c | 1 |
| 06. | X නිවැරදි නම් | 1 |
| | Y නිවැරදි නම් | 1 |
| 07. | $1/10$ | 2 |
| 08. | a හා c සඳහා | 1 + 1 |
| 09. | නිවැරදි වෙන් කිරීමට | 1 |
| | නම් කිරීමට | 1 |
| 10. | 12, 24, 36 ..... නිවැරදි පිළිතුරක් | 1 + 1 |
| 11. | (i) සමචතුරස්‍රය | 1 |
| | (ii) ත්‍රපීසියම | 1 |
| 12. | 64, 81 | 1 + 1 |
| 13. | *3l − 150ml* | 1 |
| | *2l 850ml* | 1 |
| 14. | (i) මුහුණත් ගණන = 4 | 1 |
| | (ii) දාර ගණන = 6 | 1 |
| 15. | 9:2 | 2 |
| 16. | (i) $2^2 \times 3^3$ | 1 |
| | (ii) 200 | 1 |
| 17. | $9cm^2$ (ඒකක නොමැති නම් ල. 1) | 2 |
| 18. | (i) 19 | 1 |
| | (ii) 9 | 1 |
| 19. | 5යි | 2 |
| 20. | 2kg 250g | 2 |

| ප්‍රශ්න අංකය | පිළිතුර | ලකුණු |
|---|---|---|
| 01. (i) | මීටර් රූල, මිනුම් පටිය, නිවැරදි පිළිතුරක් | 1 |
| (ii) | 1215cm | 1 |
| (iii) | 1m 5cm | 2 |
| (iv) | 132 mm | 2 |
| (v) | 1m 67 cm/167cm | 2 |
| (vi) | 48cm 8mm | 2 |
| (vii) | 38m 10cm | 3 |
| (viii) | 3.1m/310cm | 3 |
| 02. a (i) | 2, 3, 6, 7, 14, 21 නිවැරදි තුනකට | 3 |
| (ii) | 12×12 | 1 |
| | රු. 144 | 1 |
| (iii) | 0 හා 5 | 1 + 1 |
| b (i) | 17.63 | 2 |
| (ii) | 50.02 | 2 |
| 03. a (i) | ඉරට්ට සංඛ්‍යාවක් | 1 |
| (ii) | ඔත්තේ සංඛ්‍යාවක් | 1 |
| (iii) | 10, 15 | 1 + 1 |
| (iv) | 2 | 2 |
| (v) | 4201 | 2 |
| b (i) | x + 40 | 2 |
| (ii) | රු. 55 | 1 |
| 04. (i) | සඳුදා | 1 |
| (ii) | 40 | 1 |
| (iii) | බදාදා, සිකුරාදා | 1 |
| (iv) | සෙන. ● ●, ඉරිදා ● ◖ | 2 + 2 |
| (v) | 255 | 2 |
| (vi) | 255 × 60 = රු. 15 300 | 1 + 1 |

| | | | |
|---|---|---|---|
| 05. | (i) | $\frac{1}{2}, \frac{1}{4}$ | 1 |
| | (ii) | $\frac{1}{2}$ | 1 |
| | (iii) | $\frac{4}{10}$ | 1 |
| | (iv) | ~~0.4~~ හෝ 0.5 | 2 |
| | (v) | $1.5 > 0.5 > 0.03$ | 3 |
| | (vi) | $\frac{1+2+4}{12} = \frac{7}{12}$ | 2 + 1 |
| 06. | a (i) | නිරිත දිශාව | 1 |
| | (ii) | පුස්තකාලය | 2 |
| | (iii) | උතුරින් | 2 |
| | (iv) | දකුණු දිශාව | 2 |
| | b (i) | P = +2 | 1 |
| | | Q = -2 | 1 |
| | (ii) | $2 > -2$ | 2 |
| 07. | (i) | 6 533 172 | 2 |
| | (ii) | හය මිලියන පන්සිය තිස්තුන් දහස් එකසිය හැත්තෑ දෙක | 3 |
| | (iii) | 100 | 2 |
| | (iv) | නිවැරදි නිරූපණයට | 2 |
| | (v) | $3^4$ | 2 |

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**වර්ෂ අවසාන ඇගයීම**

**6 ශ්‍රේණිය**

**ගණිතය**

කාලය : පැය 02


නම:-........................................................... විභාග අංකය:-.......................................................

සැලකිය යුතුයි.

- I පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

## I කොටස


01. දී ඇති වෘත්තය මත පිහිටන සේ A නම් ලක්ෂ්‍යයක් ද වෘත්තය පිටත B නම් ලක්ෂ්‍යයක් ද ලකුණු කරන්න.



02. 2 300 008 මෙම සංඛ්‍යාව කියවන ආකාරය ලියා දක්වන්න.

03. අගය සොයන්න. $350 \div 14$


04.




(i) ඉහත සංඛ්‍යා රේඛාවේ P මඟින් නිරූපිත සංඛ්‍යාව කීය ද? ......................................

(ii) P හා R යන සංඛ්‍යා දෙකෙන් විශාල සංඛ්‍යාව කීය ද? ......................................

05. රූපයේ දැක්වෙන




(i) සෘජු කෝණයක් නම් කරන්න. ..................................................

(ii) මහා කෝණයක් නම් කරන්න. ..................................................

06. ගුරු මේසය මත ගිනි පෙට්ටියක් තබා ඇත්නම් එහි දක්නට ඇති

(i) තිරස් දාර ගණන කීය ද?


(ii) සිරස් දාර ගණන කීය ද?


07. පහත දී ඇති භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.

$\frac{1}{5}, \frac{1}{2}, \frac{1}{3}, \frac{1}{4}$

08. පහත දී ඇති ද්‍රව්‍යය කාන්ඩ දෙකකට වෙන්කර රවුම් තුළ ලියා දක්වන්න.


පෑන, කලිසම, මකනය, පැන්සල, කමිසය, බැනියම

(i) 

(ii) 

09. රොම්බසයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

10. රූපයේ පරිමිතිය සොයන්න.




11. 18 ප්‍රගණන ලකුණින් දක්වන්න.

12. අගය සොයන්න. 13.62 + 4.79

13. 4, 22 හි සාධකයක් ද නැද්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

14. > හෝ < අසමානතා ලකුණ ගැළපෙන පරිදි හිස්තැන් තුළ යොදන්න.

(i) 2.51 -------- 2.05

(ii) $\frac{28}{100}$ --------- $\frac{3}{10}$

15. පහත දැක්වෙන ප්‍රකාශනවලින් දැක්වෙන්නේ ඥාතයක් ද අඥාතයක් ද යන්න ඉදිරියෙන් ඇති තිත්මත ලියා දක්වන්න.

(i) අල 1kg ට අල්ලන අල ගෙඩි ගණන....................................

(ii) සතියකට ඇති දින ගණන ........................................................

16. බස් රථයක සිටි මගීන් ගණන x වේ. ඉන් මගීන් 4 දෙනෙක් බැස ගිය පසු ඉතිරි වූ මගීන් ගණන දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ලියා දක්වන්න.

17. පොල් ගොඩක ඇති ගෙඩි ගණන ආසන්න දහයට වටැයූ විට ලැබුනු අගය 50කි. එම පොල් ගොඩෙන් ගෙඩියක් ඉවත් කර ආසන්න දහයට වටැයූ විට ලැබුනු අගය 40ක් නම් ගොඩෙහි තිබූ පොල්ගෙඩි ගණන කීය ද?

18. අගය සොයන්න.

| මිනිත්තු | තත්පර |
|---|---|
| 12 | 16 |
| − 4 | 18 |

19. ඇමරිකන් ඩොලර් 1ක වටිනාකම රු. 180ක් වූ දිනක ඇමරිකන් ඩොලර් 100ක් සඳහා ලැබෙන රුපියල් ගණන සොයන්න.

20. රුපියල් 2ක් හා ශත විසි පහක් අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4කටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

01. (a) ඔබ පන්ති කාමරයේ දී ඉගෙනගත් ඝන වස්තු පාඩම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් සකස්කළ ඝන වස්තු තුනක නම් ලියන්න.

(ii) ඉන් එක් ඝන වස්තුවක් සෑදීමට යොදාගත් පතරමක රූප සටහනක් ඇඳ දක්වන්න.

(iii) ඔබ සාදාගත් ත්‍රිකෝණාකාර මුහුනත් පමණක් සහිත ඝන වස්තුවේ දාර ගණන, ශීර්ෂ ගණන හා මුහුණත් ගණන වෙන වෙනම ලියා දක්වන්න.

(b) පංතියක ළමුන් පිරිසක් පළතුරු බීම සෑදීම සඳහා දොඩම් යුෂ ලීටර 2ක් හා දෙහි යුෂ 500*ml* ක් ගෙන එන ලදී.

(i) ගෙන ආ දොඩම් යුෂ ප්‍රමාණය මිලි ලීටර කීය ද?

(ii) දොඩම් යුෂ හා දෙහි යුෂ මිශ්‍රකර ඊට ජලය ලීටර 4ක්ද එකතු කර පළතුරු බීම සාදන ලදී නම් සාදාගත් බීම ප්‍රමාණය ලීටර හා මිලි ලීටර වලින් ලියන්න.

(iii) එක් ළමයකුට බීම 250*ml* බැගින් ලැබෙන සේ ළමුන් කී දෙනකු අතර සාදාගත් බීම ප්‍රමාණය බෙදාදිය හැකි ද?

(iv) බීම මිශ්‍රණයේ ඇති දොඩම් යුෂ, දෙහි යුෂ හා ජලය අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

02. ළමුන් පිරිසක් විසින් කිසියම් ක්‍රීඩාවක් සඳහා යොදා ගැනීමට ලියන ලද සංඛ්‍යා සටහනක් පහත දැක්වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 |
| 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |

(i) සටහනේ දැක්වෙන 10ට අඩු ඉරට්ට සංඛ්‍යා මොනවා ද?

(ii) එහි ඇති 18ත් 28ත් අතර වූ ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න.

(iii) එහි දැක්වෙන විශාලතම සමචතුරස්‍ර සංඛ්‍යා දෙක ලියන්න.

(iv) සටහනේ දැක්වෙන 1ත් 10ත් අතර වූ ත්‍රිකෝණ සංඛ්‍යා ලියා දක්වන්න.

(v) 18 හි සියළු සාධක ලියා දක්වන්න.

03. වෙළෙන්දෙක් එක් දිනක විකුණන ලද ද්‍රව්‍යය පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

| ද්‍රව්‍යය | විකුණූ ප්‍රමාණය | 1kgක විකුණුම් මිල |
|---|---|---|
| අල | 15kg | රු. 120 |
| ලොකු ළූණු | 5kg 500g | රු. 150 |
| පරිප්පු | 8kg | රු. 140 |

(i) විකුණන ලද පරිප්පු ප්‍රමාණය ග්‍රෑම් කීයද?

(ii) විකුණන ලද සියළු ද්‍රව්‍යවල ස්කන්ධය කොපමණ ද?

(iii) සියළුම ද්‍රව්‍යය විකිණීමෙන් එදින වෙළෙන්දා ලැබූ මුළු මුදල කොපමණ ද?

04. (i) 3 × 3 × 3 × 3 යන්න දර්ශක අංකනයෙන් ලියන්න.

(ii) $2^5$ යන්න ප්‍රසාරණය කර ලියන්න.

(iii) $2^2 \times 3^2$ හි අගය සොයන්න.

(iv) 16, 2 හි බලයක් ලෙස ලියන්න.

(v) $2^3$ හා $3^2$ යන අගයන්ගෙන් විශාලතම අගය සොයන්න.

05. කොටුව තුළ දී ඇති භාග ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

$$\frac{1}{4}, \frac{3}{4}, \frac{6}{8}, \frac{2}{9}, \frac{2}{3}, \frac{8}{12}, \frac{8}{9}$$

(i) ඒකක භාගයක් ලියා දක්වන්න.

(ii) $\frac{3}{4}$ සඳහා තුල්‍යය භාගයක් ලියා දක්වන්න.

(iii) $\frac{8}{12}$ සඳහා සරලම තුල්‍යය භාගය ලියා දක්වන්න.

(iv) සුළු කරන්න. $\frac{2}{9} + \frac{2}{3}$

(v) සුළු කරන්න. $\frac{3}{4} - \frac{1}{2}$


06. සනත් පළමු වාර පරීක්ෂණයේ දී විෂයයන් 5කට ලබාගත් ලකුණු පහත වගුවේ දැක්වේ.

| විෂයය | ලකුණු ගණන | වටැයූ විට අගය |
|---|---|---|
| ගණිතය | 77 | .......................... |
| ඉංග්‍රීසි | 65 | .......................... |
| විද්‍යාව | 72 | .......................... |
| සිංහල | 69 | .......................... |
| ආගම | 60 | .......................... |
| එකතුය | .......................... | .......................... |

(i) මෙම වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන එහි දැක්වෙන ලකුණු ගණන ආසන්න 10 ගුණාකාරයට වටයා ලියන්න.


(ii) සනත් ලබාගත් ලකුණුවල එකතුය හා එම ලකුණු වටැයූ විට ලැබුණු අගයන්ගේ එකතුය සොයන්න.

(iii) සනත් ලබාගත් මුළු ලකුණු ගණන හා වටැයූ පසු ලකුණු ගණනේ එකතුයන් අතර වෙනස කොපමණ ද?

07. (a) එක් දිනක් තුළ බස් රථයක් ගමන් ගත් වාර 4කදී ගමන් ගත් මඟීන් ගණන පහත වගුවේ දක්වේ.  කින් මඟීන් 10ක් දැක්වෙන සේ ඉහත වගුවේ දත්ත චිත්‍ර ප්‍රස්තාරයක් මඟින් දක්වන්න.

| වාර ගණන | මඟීන් ගණන |
|---|---|
| 1 වාරය | 55 |
| 2 වාරය | 70 |
| 3 වාරය | 60 |
| 4 වාරය | 45 |

(b) රූපයේ දැක්වෙන කුඩා සමචතුරස්‍ර කොටුවක පැත්තක දිග 1cm ක් වේ.




(i) ABCD රූපයේ පරිමිතිය කොපමණ ද?

(ii) රූපයේ අඳුරු කර ඇති කොටුවේ වර්ගඵලය කොපමණ ද?

(iii) මුළු රූපයේ වර්ගඵලය කොපමණ ද?

ANSWERS
No 02


# Grade 6 Maths 3rd term Online Paper No - 02

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | පිළිතුරු පත්‍රය |
|---|---|---|---|---|---|---|

## I පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. |  | 1+1 | 2 |
| 02. | දෙමිලියන තුන්සිය දහස් අට | | 2 |
| 03. | 25 | | 2 |
| 04. | (i) -3 | 1 | |
| | (ii) 2 | 1 | 2 |
| 05. | (i) a | 1 | |
| | (ii) d | 1 | 2 |
| 06. | (i) 8 | 1 | |
| | (ii) 4 | 1 | 2 |
| 07. | $\frac{1}{5}, \frac{1}{4}, \frac{1}{3}, \frac{1}{2},$ | | 2 |
| 08. | (i) පෑන, මකනය, පැන්සල (ii) කලිසම, කමිසය, බෑනියම | 1+1 | 2 |
| 09. | පාද සියල්ල සමාන වීම | 1 | |
| | සම්මුඛ පාද සමාන්තර වීම | 1 | 2 |
| 10. | $23+17+23+17$ | 1 | |
| | 80m | 1 | 2 |
| 11. | 卌 卌 卌 III | | 2 |
| 12. | 18.41 | | 2 |
| 13. | නැත, 4න් බෙදූ විට 2ක් ඉතිරි වේ. | 1+1 | 2 |
| 14. | (i) $2.51 > 2.05$ | 1 | |
| | (ii) $\frac{28}{100} < \frac{3}{10}$ | 1 | 2 |
| 15. | (i) අඥාත | 1 | |
| | (ii) ඥාත | 1 | 2 |
| 16. | x - 4 | | 2 |
| 17. | 45 | | 2 |
| 18. | මිනිත්තු 7 තත්පර 58 | | 2 |
| 19. | රු. 180 × 100 | 1 | |
| | රු. 18000 | 1 | 2 |
| 20. | 200 : 25 | 1 | |
| | 8 : 1 | 1 | 2 |
| | | | 40 |

### II කොටස

| | | | |
|---|---|---|---|
| 01. | a) (i) ඝනකය | 1 | |
| | ඝනකාභය | 1 | |
| | සවිධි චතුස්තලය | 1 | 3 |
| | (ii) සුදුසු පතරොමකට | | 2 |
| | (iii) දාර ගණන - 6 | 1 | |
| | ශීර්ෂ ගණන - 4 | 1 | |
| | මුහුණත් ගණන - 4 | 1 | 3 |
| | (b) (i) 2000*ml* | | 1 |
| | (ii) 6*l* 500*ml* | | 2 |
| | (iii) $\frac{6500}{250}$ | 1 | |
| | 26 | 1 | 2 |
| | (iv) දොඩම් දෙහි ජලය | | |
| | 2000:500:4000 | 1 | |
| | 4 : 1 : 8 | 2 | 3 |
| | | | 16 |
| 02. | (i) 2, 4, 6, 8 | | 2 |
| | (ii) 19, 23 | | 2 |
| | (iii) 16, 25 | | 2 |
| | (iv) 3, 6 | | 2 |
| | (v) 1, 2, 3, 6, 9, 18 | | 3 |
| | | | 11 |





| | | |
|---|---|---|
| 03. (i) 8000g | | 2 |
| (ii) 28kg 500g | | 2 |
| (iii) අල < රු. 1800. | 2 | |
| ළූනු < රු. 825 | 2 | |
| පරිප්පු < රු.1120 | 2 | |
| රු. 3745 | 1 | 7 |
| | | 11 |

| | | |
|---|---|---|
| 04. (i) $3^4$ | | 2 |
| (ii) $2 \times 2 \times 2 \times 2 \times 2$ | | 2 |
| (iii) $2 \times 2 \times 3 \times 3 = 36$ | | 2 |
| (iv) $2 \times 2 \times 2 \times 2$ | 1 | |
| $= 2^4$ | 1 | 2 |
| (v) $2^3 = 8$ | 1 | |
| $3^2 = 9$ | 1 | |
| විශාලතම අගය $= 3^2$ | 1 | 3 |
| | | 11 |

| | | |
|---|---|---|
| 05. (i) $\frac{1}{4}$ | | 1 |
| (ii) $\frac{6}{8}$ | | 2 |
| (iii) $\frac{8}{12} \div \frac{4}{4} = \frac{2}{3}$ | | 2 |
| (iv) $\frac{2}{9} + \frac{6}{9}$ | 1+1 | |
| $\frac{8}{9}$ | 1 | 3 |
| (v) $\frac{3}{4} - \frac{2}{4}$ | 1+1 | |
| $\frac{1}{4}$ | 1 | 3 |
| | | 11 |

| | | |
|---|---|---|
| 06. (i) 80 | 1 | |
| 70 | 1 | |
| 70 | 1 | |
| 70 | 1 | |
| 60 | 1 | 5 |
| (ii) 343 | 2 | |
| 350 | 2 | 4 |
| (iii) 350 - 343 | 1 | |
| 7 | 1 | 2 |
| | | 11 |

07. a)

| | | Marks | |
|---|---|---|---|
| 1 වාරය |  | 2 | |
| 2 වාරය |  | 1 | |
| 3 වාරය |  | 1 | |
| 4 වාරය |  | 2 | 6 |

| | | |
|---|---|---|
| (b) (i) 16cm | 2 | |
| (ii) $1cm^2$ | 1 | |
| (iii) $16cm^2$ | 2 | 5 |
| | | 11 |

# Grade 6 Maths 3rd term Online Paper No - 03

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**6 ශ්‍රේණිය**

**වර්ෂ අවසාන ඇගයීම**


**ගණිතය**


කාලය : පැය 02

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

1) 54 558 යන සංඛ්‍යාවේ වටිනාකම 500 නිරූපනය වන 5 ඉලක්කම වටා රවුමක් අඳින්න.

2)  දී ඇති වෘත්තය මත ලක්ෂ්‍යක් ලකුණු කර එය A ලෙස නම් කරන්න.

3) 


දී ඇති සංඛ්‍යා රේඛාවේ දක්වා ඇති A හා B අසමානතා ලකුණක් මඟින් සම්බන්ධ කර ලියන්න.

4) හිස්තැන් පුරවන්න.


* චතුස්තලයක ඇති මුහුණත් සංඛ්‍යාව .................................... කි.

* චතුස්තලයේ එක් මුහුණතක හැඩය .................................... වේ.


5) ජනිත් සෑදූ ඝනකයේ දාර සියල්ලේම දිග 60 cm කි. ඝනකයේ දාරයක දිග සොයන්න.

6) 17.00 ට ආරම්භ වූ ධර්මදේශනය 18:20 ට අවසන් විය. ධර්ම දේශනාව සඳහා කොපමණ කාලයක් ගතවූයේද?

7) ඊසාන දිශාවට මුහුණලා සිටින කවීන්ගේ දකුණු අත පැත්තේ පිහිටි දිශාව කුමක්ද?


8) 

කොටු ජාලයේ එක් කොටුවක වර්ගඵලය 1 $cm^2$ ක් නම් පාට කර ඇති රූපයේ වර්ගඵලය සොයන්න.

9) 


රූපයේ ලකුණු කර ඇති කෝණය සුළු කෝණයකි. එහි ඇති අනෙක් කෝණය ලකුණු කර එහි නම ලියන්න.

10) තුල්‍ය භාග පිළිබඳ දැනුම භාවිතයෙන් පහත හිස්තැන් පුරවන්න.





11) 8.05 - 2.5 සුළු කරන්න.

12) 95 ආසන්න 10 ගුණාකාරයට වටයන්න.

13) 

දී ඇති රූපයේ – ක් පාට කරන්න.

14) 


සංඛ්‍යා දෙකක එකතුව සනක රාමුවක නිරූපනය කර ඇත. එකතු කළ සංඛ්‍යා දෙක වෙනස් වර්ණ වලින් දක්වා ඇත. එකතු කල සංඛ්‍යා පහත හිස්තැන් මත ලියන්න.


................. + ................. = 335.

15) 2 හි සහ 5 හි යන සංඛ්‍යා දෙකෙහිම ගුණාකාර වන සංඛ්‍යා දෙකක් පහත සංඛ්‍යා වලින් තෝරා යටින් ඉරක් අඳින්න.

120 , 115 , 24 , 60


16) 13 යන සංඛ්‍යාව ප්‍රගණන ලකුණු මගින් නිරූපනය කරන්න.

17)




තැටි තරාදියක A තැටියට 3 kg ක ස්කන්ධයක් සහිත සීනි පාර්සලයක් දමා ඇත. 250g බැගින් වූ සීනි පාර්සල් B තැටියට දමා තැටි දෙක සමතුලිත කිරීමට 250 සීනි පාර්සල් කීයක් B තැටියට දැමිය යුතුද?

18)





රූපය තුල දක්වා ඇති නම් සුදුසු පරිදි කාණ්ඩ දෙකකට වෙන් කළ හොත් එම කාණ්ඩ දෙකට සුදුසු නම් හිස්තැන් වල ලියන්න.

.............................................

.............................................

19) රෙදි මීටරයක මිල රුපියල් 120.00 කි. එවැනි රෙදි මීටර් 6 ක මිල කීයද?

20)




දී ඇති සෘජුකෝණාස්‍රයෙන් c කොටස කපා ඉවත් තල විට ලැබෙන රූපයේ නම ලියන්න.

**II කොටස**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න

1) a. සිසුන් කණ්ඩායමක් විසින් පැයක කාලයක දී පාරේ ගමන් කළ වාහන පිළිබඳ තොරතුරු සටහන් කළ වගුවක් පහත දැක්වේ.

| වාහන වර්ගය | ප්‍රමාණය |
|---|---|
| කාර් | 18 |
| වෑන් | 16 |
| ත්‍රීවීලර් | 26 |
| මෝටර් සයිකල් | 20 |
| බස් | 13 |

i. ◯ = වාහන 4 ක් නිරූපණය වන සේ ඉහත දත්ත චිත්‍ර ප්‍රස්තාරයක දක්වන්න. (ල.06)

| | |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

ii. මෙම කාලය තුල දී පාරේ වැඩියෙන්ම ගමන් කර ඇත්තේ කුමන වාහන වර්ගයද? (ල.02)

b. i. A තීරුවේ ඇති ස්කන්ධ මැනීමට සුදුසු මිනුම් උපකරණ B තීරුවෙන් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| රත්‍රං මුද්දක ස්කන්ධය | බිම් තරාදිය. |
| ශිෂ්‍යයෙකුගේ ස්කන්ධය | තැටි තරාදිය. |
| | ඉලෙක්ට්‍රොනික් තරාදිය |

(ල.02)

(ii) රත්‍රං මුද්දෙහි ස්කන්ධය $4000mg$ ක් වේ. එම ස්කන්ධය ග්‍රෑම් වලින් ලියන්න. (ල.02)

(c) A හා B පාර්සල් දෙකක ස්කන්ධ පහත රූපයේ දැක්වේ.

| A | B |
|---|---|
| $2.7\ kg$ | $2kg\ 750g$ |

i. හිස්තැනට ගැළපෙන සේ < හෝ > සංකේත යොදන්න.

A …….. B (ල.02)

ii. ඉහත A හා B පාර්සල් දෙකෙහි ස්කන්ධ අතර වෙනස සොයන්න. (ල02)


2. (i) හිස්තැන් පුරවන්න.

$2^5$ යන්නෙහි ,

පාදය .......................... වේ.

දර්ශකය .......................... වේ. (ල.02)

(ii) හිස්කොටු සම්පූර්ණ කරන්න. (ල.09)





3. (i) 90ත් 100ත් අතර ඔත්තේ සංඛ්‍යා 2 ක් හා ඉරට්ට සංඛ්‍යා 2 ක් ලියන්න. (ල02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ ඉදිරියේ හරි නම් √ ලකුණ ද වැරදි නම් X ලකුණ ද යොදන්න. (ල03)

* එකට වඩා විශාල, ප්‍රථමක සංඛ්‍යා නොවන පූර්ණ සංඛ්‍යා, සංයුත සංඛ්‍යා ලෙස හැඳින්වේ. (   )
* ප්‍රථමක සංඛ්‍යා කිසිවක් ඉරට්ට සංඛ්‍යා නොවේ. (   )
* කුඩාම ප්‍රථමක සංඛ්‍යාව දෙක වේ. (   )

(iii) ත්‍රිකෝණ සංඛ්‍යාවක් වෘත්ත මගින් නිරූපනය සඳහා අඳින ලද අවසාන පේළිය පහත පරිදි දක්වා ඇත.



(a) ඉහත රටාව සම්පූර්ණ කරන්න. (ල02)

(b) එවිට ලැබෙන ත්‍රිකෝණ සංඛ්‍යාව ලියන්න. (ල01)

(c) එය කීවැනි ත්‍රිකෝණ සංඛ්‍යාවද ? (ල01)

(iv) 4 සමචතුරස්‍ර සංඛ්‍යාවක් වුවද 8 සමචතුරස්‍ර සංඛ්‍යාවක් නොවේ. හේතු සඳහන් කරන්න. (ල02)

4) (a) 6 ශ්‍රේණියේ සිසුන් යම් සංඛ්‍යාවක් සිටී.

(i) 6 ශ්‍රේණියේ සිසුන් සංඛ්‍යාව දැක්වීම සඳහා ඔබ කැමති <u>අඥාතයක්</u> ලබා දෙන්න. (ල01)

(ii) අළුතින් සිසුන් 7 ක් පංතියට ඇතුළත් වූයේ නම් ඔබ ලියූ අඥාතය ඇසුරින් දැන් පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න. (ල02)


(iii) පංතියේ මුලින් සිටි සිසුන් සංඛ්‍යාව 33 ක් නම් දැන් පංතියේ සිසුන් කී දෙනෙක් සිටිත් ද? (ල02)

(b) (i) පහත දැක්වෙන අවස්ථා අතුරින් දිගක් දැක්වෙන අවස්ථා තෝරා යටින් ඉරක් අඳින්න. (ල02)

ලෑල්ලේ ඝනකම විදුලි කණුවේ උස ලිඳේ ගැඹුර පාර්සලයක ස්කන්ධය

(ii) මේසයක දිග 1 m 5 cm කි. එම දිග සෙන්ටිමීටර වලින් දක්වන්න. (ල01)

(iii)




(අ) ඉහත රූපයේ දැක්වෙන ඍජුකෝණාස්‍රාකාර ඉඩම වටා මුරකරුවෙකු එක් වටයක් යන විට ගමන් කරන දුර කොපමණද?. (ල02)

(ආ) ඔහු දිනකට වාර 10ක් ඉඩම වටා ගමන් කරයි නම්, එක් දිනකදී ඔහු ඉඩම වටා ගමන් කරන මුළු දුර කොපමණද? (ල01)

5) (i) 12 : 36 යන අනුපාතය කියවන ආකාරය ලියන්න. (ල01)

(ii) 3 : 7 අනුපාතයට තුල්‍ය අනුපාතයක් ලියන්න. (ල01)

(iii) පළතුරු යුෂ $2l$ කට ජලය ලීටර 5 ක් එකතු කරන ලදි. මිශ්‍රණයේ ඇති ජලය හා පළතුරු යුෂ අතර අනුපාතය ලියන්න. (ල02)

(iv) පළතුරු යුෂ 6 $l$ ක් ඉහත (iii) හි අනුපාතයට මිශ්‍ර කිරීමට ජලය ලීටර කීයක් අවශ්‍යද? (ල01)

(v) පහත දැක්වෙන අවස්ථා අතුරින් අනුපාතික දැක්වෙන අවස්ථා තෝරා යටින් ඉරක් අඳින්න. (ල02)

- ලේන්සුවක මිල රුපියල් 30.00 කි.
- කේක් සෑදීමට පිටි කිලෝ ග්‍රෑම් 1කට මාගරින් ග්‍රෑම් 750 ක් යොදා ගැනේ.
- වාහනයක් ඉන්ධන ලීටරයකින් කිලෝමීටර 18ක් දුර ගමන් කරයි.

(vi) ඇමෙරිකන් ඩොලර් 1 ක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 183.00 ක් වූ දිනෙක ශ්‍රී ලංකා රුපියල් 36 600.00 ක් ඇමෙරිකන් ඩොලර් කීයද? (ල02)

6) a. (i) පහත අවස්ථාවලට අවශ්‍ය ද්‍රව ප්‍රමාණ දැක්වීමට සුදුසු ඒකකය ලීටරද මිලිලීටරද යන්න සඳහන් කරන්න. (ල02)

* තෙල් බවුසරයක අල්ලන ඉන්ධන ප්‍රමාණය ..................

* ඇසකට වරකට වත් කරන දියර බෙහෙත් ප්‍රමාණය ...........................

(ii) තේ කෝප්පයක අල්ලන කිරි තේ ප්‍රමාණය මිලි ලීටර 175 කි. එවැනි තේ කෝප්ප 25 ක ඇති කිරි තේ ප්‍රමාණය ලීටර හා මිලිලීටර වලින් දක්වන්න. (ල03)

(iii) එක්තරා බඳුනක් සම්පූර්ණයෙන් පිරවීමට ජලය 550 $ml$ ක් අවශ්‍ය වේ. තවත් බඳුනක් සම්පූර්ණයෙන් පිරවීමට ජලය 1 $l$ ක් අවශ්‍ය වේ. පළමු බඳුනෙන් දෙවරක් දෙවන බඳුනට ජලය අපතේ නොයන පරිදි දැමූ විට දෙවන බඳුන උතුරා යයිද නොයයිද? හේතු සහිතව පැහැදිලි කරන්න. (ල03)

b. භාග එකතු කිරීම සඳහා පහත හිස්තැන් පුරවන්න (ල 03)

$\frac{1}{4} + \frac{3}{8}$

$= \frac{\square}{\square} + \frac{3}{8}$

$= \frac{\square}{8}$


# Grade 6 Maths 3rd term Online Paper No - 03

**ගණිතය පිළිතුරු පත්‍රය**

6 ශ්‍රේණිය

**I කොටස**

1. 54 (5) 58

2. 


3. A < B හෝ -3< 1

4. මුහුණත් 4 යි.


   එක් මුහුණතක හැඩය ත්‍රිකෝණාකාර වේ.

5. 5 cm

6. 18.30 – 17.00 = 01.30 පැය 1 යි මිනිත්තු 30

7. ගිනිකොණ


8. 6 $cm^2$

9.  පරාවර්තන කෝණයකි.

10. $\frac{6}{8}$ — $^{3}/_{4}$ , $^{18}/_{24}$

11. 8.05 – 2.5 = 5.55

12. 100

13. 

14. 335

15. (120) 115 24 (60)

16. 

17. $\frac{3000}{250} = 12$ සීනි පාර්සල් 12

18. ගැහැණු ළමයි

පිරිමි ළමයි

19. 120 X 6 = රු. 720

20. ත්‍රිපීසියම

## II කොටස

01) (a)

**i.**

| | |
|---|---|
| **කාර්** | ○○○○◖ |
| **වෑන්** | ○○○○ |
| **ත්‍රීවිලර්** | ○○○○○○◖ |
| **මෝටර්සයිකල්** | ○○○○○ |
| **බස්** | ○○○◖ |

( ලකුණු 06)

ii. ත්‍රීවිලර් ( ලකුණු 02)

(b)

i. රත්‍රං මුද්දක සකන්ධය - ඉලෙක්ට්‍රොනික් තරාදිය ( ලකුණු 02)

ශිෂ්‍යයෙකුගේ ස්කන්ධය - බිම් තරාදිය ( ලකුණු 02)

ii. 4 g ( ලකුණු 02)

(c)

i. A < B ( ලකුණු 02)


ii. 2.750 kg – 2.700kg = 50 g ( ලකුණු 02)

02)

i. පාදය 2

දර්ශකය 5

ii.





03)

i. නිවැරදි පිළිතුර සඳහා ( ලකුණු02)

ii. • ✓

• X ( ලකුණු03)

• ✓

iii. (a)  ( ලකුණු02)

(b) 21 ( ලකුණු01)

(c) 6 වන ත්‍රිකෝණ සංඛ්‍යාවට ( ලකුණු01)

iv. නිවැරදි පිළිතුරට ( ලකුණු02)

04)

(a)

i. සුදුසු අක්ෂරයකට ( ලකුණු01)

ii. $x + 7$ ( ලකුණු02)

iii. $33 + 7 = 40$ ( ලකුණු02)

(b)

i. විදුලි කණුවේ උස
ලෑල්ලේ ඝනකම
ළිඳේ ගැඹුර } ( ලකුණු02)

ii. 105 cm ( ලකුණු01)

iii. (අ) 130 X 2 + 70 X 2

260+140 = 400m ( ලකුණු02)

(ආ) 400 X 10 = 400m / 4 km ( ලකුණු01)

05)

i. 12 : 36
දොළහ අනු තිස්හය ( ලකුණු01)

ii. නිවැරදි ඕනෑම පිළිතුරක් ( ලකුණු02)

iii. 5 : 2 ( ලකුණු02)

iv. 15 $l$ (ලකුණු02 )

v. නිවැරදි පිළිතුරට ( ලකුණු02)

vi. $\frac{36\ 600.00}{183}$ ඇමෙරිකන් ඩොලර් 200 ( ලකුණු02)

06)

i. ලීටර් (ලකුණු01)

මිලි ලීටර් (ලකුණු01)

ii. 175 X 25 = 4375 $ml$

$4\ l\ \ 375\ ml$ ( ලකුණු03)

iii. 550 X 2 = $1100ml$ (ලකුණු01)

බඳුන උතුරා යයි. (ලකුණු01)

$1{,}100\ ml > 1{,}000ml$ (ලකුණු01)

(b)

$$\frac{1}{4} + \frac{3}{8}$$

$$\frac{\boxed{2}}{\boxed{8}} + \frac{\boxed{3}}{\boxed{8}}$$

$$\frac{\boxed{5}}{8}$$

(ලකුණු03)

# Grade 6 Maths 3rd Term Online Paper No - 04

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### වර්ෂ අවසාන ඇගයීම

6 ශ්‍රේණිය | **ගණිතය** | කාලය පැය 2 යි

| නම/ විභාග අංකයඃ |
|---|


### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I කොටස සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලැබේ.


01. 𝍸 𝍸 // ප්‍රගණන ලකුණ මගින් නිරූපණය වන සංඛ්‍යාව ලියන්න.

02. හිස්තැනට සුදුසු අගය යොදා සම්පූර්ණ කරන්න.
(i) 1kg = ග්‍රෑම් 200 ඒවා ............ යි.
(ii) 1kg = ග්‍රෑම් 500 ඒවා ............ යි.


03. දී ඇති සංඛ්‍යා රේඛාවේ A හා B අතර පවතින නිඛිල සියල්ල ලියන්න.




04. A ලෙස නම් කර ඇති සංඛ්‍යා කාණ්ඩයට පොදු වූ ලක්ෂණය අනුව සුදුසු නමක් ලියන්න.




05. රූපයේ නිරූපණය කර ඇති **a** හා **b** කෝණ වර්ග නම් කරන්න.
a -
b -




06. හැට තුන් මිලියන හතර යන සංඛ්‍යාව සම්මත ආකාරය ලියන්න.

07. ශලනි ළඟ රුපියල් ***x*** මුදලක් ඇත. එයින් රුපියල් **10** ක මුදලක් වියදම් විය. ඇය ළඟ ඉතිරි වූ මුදල සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.


08. දී ඇති ප්‍රකාශ අතරින් විචල්‍ය දක්වෙන අවස්ථා තෝරා ✓ ලකුණ යොදන්න.
(i) කිලෝග්‍රෑමයකට අල්ලන නාරං ගෙඩි ගණන ( )
(ii) කිලෝග්‍රෑමයකට ඇති ග්‍රෑම් ගණන ( )

09. හිස්තැනට සුදුසු අගයන් යොදා සම්පූර්ණ කරන්න.

| | kg | g |
|---|---|---|
| | 2 | 150 |
| − | □ | □ |
| | 1 | 925 |


10. සුළු කරන්න. **10.8 + 3.25**

11. වෘත්තාකාර රටාවේ ඇති වෘත්ත ගණන ලියන්න.



12. පහත දී ඇති ද්‍රව ප්‍රමාණ මැනීමට සුදුසු මිනුම් ඒකක සඳහන් කරන්න.
(i) වාහනයකට යොදන පෙට්‍රල් ප්‍රමාණය (                    )
(ii) වරකට බීමට දිය යුතු බෙහෙත් ප්‍රමාණය (                    )

13. සෙල්ලම් කාරයේ ස්කන්ධය 1kg 20g වේ. එහි ස්කන්ධය ග්‍රෑම් වලින් ලියා දක්වන්න.





14. පහත දී ඇති සංඛ්‍යා ආසන්න 10 ට වටයා ලියන්න.
(i) 54          (ii) 177

15. ප.ව. 3.20, පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න.

16.  මගින් ගණිතය විෂය සඳහා ලකුණු 90 ට වැඩියෙන් ගත් සිසුන් 22 ක් නිරූපණය වේ නම්  මගින් නිරූපණය වන සිසුන් ගණන කොපමණ ද?

17. අධිවේගී මාර්ගයක ඒකාකාර වේගයෙන්, පැය 2 ක දී 180km ගමන් කරන මෝටර් රථයක් පැය 7 ක දී ගමන් කරන දුර සොයන්න.

18. මෙම පතොරම භාවිතයෙන් සාදා ගන්නා ඝන වස්තුවේ දාරයක දිග සොයන්න.




19. ස්ටර්ලිං පවුම් 1 ක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 219 ක් වූ දිනෙක ස්ටර්ලිං පවුම් 11 ක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් වලින් කොමණ ද?


20. සංඛ්‍යා ලියා ඇති කාඩ්පත් අඩංගු පෙට්ටියකින් කාඩ්පත් 2 ක් ගත් දුලාජ්, එහි තිබූ සංඛ්‍යා දෙක ගුණකර පිළිතුර 72 බව ප්‍රකාශ කළේය. ඔහුගේ නැගණිය ඉවතට ගත් කාඩ්පත් දෙකෙහි ඇති විශාල සංඛ්‍යාවෙන් කුඩා සංඛ්‍යාව අඩු කර පිළිතුර 1 බව ප්‍රකාශ කළාය. කාඩ්පත් දෙකෙහි සඳහන්ව තිබූ සංඛ්‍යා 2 ක ලියන්න.

# Grade 6 Maths 3rd Term Online Paper No - 04

**6 ශ්‍රේණිය** **II කොටස** **ගණිතය**

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද ලැබේ.**

01. (a) ගුරුභවතාගේ මග පෙන්වීම යටතේ පන්ති කාමරය තුළ සිදු කළ ක්‍රියාකාරකමකදී ශිෂ්‍යයෙකු විසින් 1cm x 1cm කොටුවලින් සිදු කළ නිර්මාණයක් පහත දැක්වේ.




(i) නිර්මාණය සඳහා භාවිතා කළ කඩදාසියේ එක් කුඩා කොටුවක වර්ගඵලය කොපමණ ද? (ල.01)

(ii) නිර්මාණය කළ රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න. (ල.03)

(iii) සිදු කළ නිර්මාණයේ අඳුරු නොකළ කොටසේ වර්ගඵලය සොයන්න. (ල.02)

(iv) අඳුරු කළ හා අඳුරු නොකළ කොටසේ වර්ගඵල අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න. (ල.02)


(b) (i) දී ඇති 1cm x 1cm කොටු දැල මත $12cm^2$ ආවරණය වන පරිදි දිග 4cm වූ සෘජුකෝණාස්‍රාය නිර්මාණය කරන්න. (ල.02)




(ii) ඔබ නිර්මාණය කළ සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ල.02)

(c) දී ඇති රූප වල පරිමිතිය සොයන්න.

(i)




(ii)




(ල.04)

02. (a) ශූර විද්‍යාලයේ 6 ශ්‍රේණියේ ගණිත ගුරුතුමිය නොපැමිණි දිනක සියළු දෙනා එක් වී එක් එක් සිසුන්ගේ නිවසේ සිටින සාමාජිකයන් සංඛ්‍යාව පිළිබඳ රැස් කළ තොරතුරු පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | 4 | 4 | 2 | 5 | 2 | 3 | 3 |
| 3 | 5 | 3 | 3 | 6 | 3 | 4 | 4 |
| 3 | 2 | 4 | 4 | 3 | 4 | 4 | 5 |
| 4 | 4 | 4 | 3 | 5 | 3 | 2 | 3 |
| 3 | 3 | 4 | 4 | 6 | 4 | 4 | 3 |

(i) තොරතුරු රැස්කළ දිනයේ පැමිණ සිටි සිසුන් ගණන ලියා දක්වන්න. (ල.01)


(ii) ඉහත තොරතුරු ඇසුරින් පහත දී ඇති ප්‍රගණන වගුව ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කර සම්පූර්ණ කරන්න. (ල.05)

| නිවසක සිටින සාමාජිකයින් සංඛ්‍යාව | අදාළ නිවාස ප්‍රගණන ලකුණු මගින් | නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| 2<br>3<br>4<br>5<br>6 | | |


(iii) වැඩිම සාමාජිකයින් ගණනක් සිටින නිවාස ගණන ලියන්න. (ල.01)

(b) කාලච්ඡේදය අවසන් වීමට තවත් කාලයක් ඉතිරිව තිබූ බැවින් ඔවුන් පාසලට පැමිණි වාහන වර්ගය පිළිබඳ තොරතුරු ද රැස්කර ගැනීමට හැකි විය. එහි දී ලබා ගත් තොරතුරු පහත දක්වා ඇත.

| වාහන වර්ගය | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| බස් රථය | 8 |
| යතුරු පැදිය | 13 |
| වෑන් රථය | 10 |
| වෙනත් ක්‍රම | 9 |

(i) සිසුන් දෙදෙනෙකු සඳහා  රූපය යොදා ගනිමින් ඉහත දත්ත චිත්‍ර ප්‍රස්තාරයකින් නිරූපණය කරන්න. (ල.04)

03. (a) ප්‍රාර්ථනාගේ මව, උපන් දින තෑග්ගක් ලෙස ලබා දුන් ගවුම දිග හැර බැලූ ඇයට ගණිත ගුරුතුමිය ඉගැන්වූ ''සංඛ්‍යා වර්ග හා සංඛ්‍යා රටා'' පාඩම සිහිපත් විය.





(i) මෙම ගවුමේ ඇති ඔත්තේ සංඛ්‍යා සියල්ල ලියන්න. (ල.02)

(ii) (1),(4),(9),(16) යන සංඛ්‍යා හඳුන්වන නම ලියන්න. (ල.01)

(iii) ප්‍රථමක සංඛ්‍යා දෙකක එකතුව ප්‍රථමක සංඛ්‍යාවක්ම ලැබෙන පරිදි මෙහි ඇති සංඛ්‍යා යුගල් 02 ක් තෝරා ලියන්න. (ල.02)

(b) ඇයගේ මව ලබා දුන් තෑගි පාර්සල අසුරනයේ පතරොම පහත දක්වා ඇත.




(i) මෙමගින් සෑදිය හැකි ඝනවස්තුව හඳුන්වන නම ලියන්න. (ල.01)

(ii) එය සෑදීමට භාවිතා කරන වෙනත් පතරොමක් අඳින්න. (ල.02)

(iii) එහි ඇති මුහුණත්, ශීර්ෂ, දාර ගණන ලියන්න. (ල.03)

04.




(a) (i) පිටි 1kg ක මිල රුපියල් 8 කින් ඉහළ ගියේ නම්, පිටි 1kg ක මිළ සඳහා $x$ ඇසුරෙන් ප්‍රකාශනයක් ලියන්න. (ල.02)

(ii) මිල ඉහළ යාමට පෙර රු. 100 ක් දී පිටි 1kg ක් මිලදී ගත් විට ඔහුට ලැබෙන ඉතිරි මුදල සඳහා $x$ ඇසුරෙන් වීජීය ප්‍රකාශනය ලියන්න. (ල.03)

(iii) සීනි 500g ක මිල රුපියල් 5 කින් අඩු වූයේ නම් එහි නව මිල සඳහා a ඇසුරෙන් වීජීය ප්‍රකාශනය ලියන්න. (ල.02)

(b) $y = 4$ වන විට පහත දී ඇති එක් එක් වීජීය ප්‍රකාශනයෙහි අගය සොයන්න.

(i) $y + 3$ (ල.02) (ii) $5 - y$ (ල.02)

05. (a) (i) 2 හි තුන් ගුණය ලියන්න. (ල.01)

(ii) a x a x b x b x b දර්ශක භාවිතයෙන් ලියන්න. (ල.01)

(iii) $3^3$ ප්‍රසාරණය කර අගය සොයන්න. (ල.02)

(b) 64 සංඛ්‍යාව,

(i) 2 හි බලයක් ලෙස ලියන්න. (ල.02)

(ii) 4 හි බලයක් ලෙස ලියන්න. (ල.02)


(c) < හෝ > හෝ = සංකේතය යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) $2^3$ .............. $3^2$ (ල.01)

(ii) $7^2$ .............. $1^{10}$ (ල.01)

(iii) $3^4$ .............. $9^2$ (ල.01)

06.




පැතුම් හා උතුම් (1) හා (50) කාඩ්පත් දෙක රූපයේ පරිදි නූලක ගැට ගසා නැගණියට කාඩ්පත්වල වූ සංඛ්‍යා දෙක අතර ඇති 9 ගුණාකාර සවිකිරීමට උපදෙස් දෙන ලදී.

(i) ඇය නූලෙහි සවි කළ 9 ගුණාකාර සියල්ල ලියන්න. (ල.03)

(ii) ඒ අතුරින් විශාලම ගුණාකාරය ලියන්න. (ල.01)

(iii) සවිකළ සංඛ්‍යා අතර ඇති ත්‍රිකෝණ සංඛ්‍යා ලියන්න. (ල.02)

(b) නූලේ එල්ලා ඇති සංඛ්‍යා සහිත කාඩ්පත් ඇලවීමට ගෙනා පුවරුවේ පහත ආකාරයේ තල රූප ඇඳ තිබුණි. එහි ඉංග්‍රීසි අක්ෂර වලින් සඳහන් කර ඇති තල රූප නම් කරන්න.


a - ..................

b - ..................

c - ..................


d - ..................

e - ..................




(ල.05)

07. (a) බඳුන අලංකරණය සඳහා භාවිතා කර ඇති,




(i) ඒකක භාග සියල්ල ලියන්න. (ල.02)

(ii) තත්‍ය භාග (නියම භාග) සියල්ල ලියන්න. (ල.02)

(b) හිස්තැන් සඳහා $>$ හෝ $<$ ලකුණ යොදා සම්පූර්ණ කරන්න.

(i) $\frac{1}{7}$ .......... $\frac{1}{6}$ (ල.01) (ii) $\frac{3}{4}$ .......... $\frac{5}{8}$ (ල.01)

(c) අගය සොයන්න.

(i) $\frac{2}{5} + \frac{1}{5}$ (ල.01)

(ii) $\frac{3}{7} + \frac{1}{14}$ (ල.02)

(iii) $\frac{7}{8} - \frac{1}{2}$ (ල.02)

# Grade 6 Maths 3rd Term Online Paper No - 04

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. | 12 | | 02 |
| 02. | (i) 5 (ii) 2 | 1+1 | 02 |
| 03. | -3, -2, -1, 0, 1, 2 | | 02 |
| 04. | 1 සිට 16 තෙක් සමචතුරස්‍ර සංඛ්‍යා (වර්ග සංඛ්‍යා) වැනි ගැලපෙන නිවැරදි පිළිතුරකට | | 02 |
| 05. | a - සුළු කෝණය<br>b - පරාවර්ත කෝණය | 1+1 | 02 |
| 06. | 63 000 004 | | 02 |
| 07. | $x$ - 10 | | 02 |
| 08. | (i) ✓ (ii) × | 1+1 | 02 |
| 09. | [0] [225] | | 02 |
| 10. | 14 . 05 | | 02 |
| 11. | 7 | | 02 |
| 12. | (i) ලීටර් (ii) මිලි ලීටර් | 1+1 | 02 |
| 13. | 1020g | | 02 |
| 14. | (i) 50 (ii) 180 | 1+1 | 02 |
| 15. | 15 : 20 | | 02 |
| 16. | 8 | | 02 |
| 17. | 630km | | 02 |
| | පැය 1 කදී = $\frac{180}{2}$ = 90km සඳහා | 01 | |
| 18. | 4cm | | 02 |
| 19. | රු. 2409 | | 02 |
| 20. | 9 හා 8 | | 02 |
| | | | **40** |

### II කොටස

| | | | |
|---|---|---|---|
| 01. | (a) (i) 1cm x 1cm = $1cm^2$ | | 01 |
| | (ii) $20cm^2$ | | 03 |
| | (iii) $6cm^2$ | | 02 |
| | (iv) 20 : 6 | 01 | |
| | 10 : 3 | 01 | 02 |
| | | | 08 |
| | (b) (i) නිවැරදි නිර්මාණයට | 02 | |
| | (ii) 14cm | 02 | 04 |
| | (c) (i) 24cm | 02 | |
| | (ii) 21cm 1mm | 02 | 04 |
| | | | 16 |
| 02. | (a) (i) 40 | | 01 |
| | (ii) නිවැරදි පිළිතුරු සඳහා ල. 1 බැගින් | | 05 |
| | (iii) 2 | | 01 |
| | | | 07 |
| | (b) නිවැරදි චිත්‍ර ප්‍රස්තාරයට | | 04 |
| | | | 11 |
| 03 | (a) (i) 1, 3, 5, 7, 9, 19 | | 02 |
| | සංඛ්‍යා 3 කට වැඩියෙන් ලියා ඇත්නම් | 01 | |
| | (ii) සමචතුරස්‍ර සංඛ්‍යා (වර්ග සංඛ්‍යා) | | 01 |
| | (iii) 2 , 3 | 01 | |
| | 2 , 5 වැනි | 01 | 02 |
| | | | 05 |
| | (b) (i) ඝනකය | | 01 |
| | (ii) නිවැරදි පතොරම | | 02 |
| | (iii) මුහුණත් - 6 | 01 | |
| | ශීර්ෂ - 8 | 01 | |
| | දාර - 12 | 01 | 03 |
| | | | 06 |
| | | | 11 |

# Grade 6 Maths 3rd Term Online Paper No - 04

පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 04. | (a) (i) රු. $x + 8$ | | 02 |
| | (ii) රු. $100 - x$ | | 03 |
| | (iii) රු. $a - 5$ | | 02 |
| | | | 07 |
| | (b) (i) $4 + 3$ | 01 | |
| | 7 | 01 | 02 |
| | (ii) $5 - 4$ | 01 | |
| | 1 | 01 | 02 |
| | | | 04 |
| | | | **11** |
| 05. | (a) (i) 6 | | 01 |
| | (ii) $a^2 \times b^3$ | | 01 |
| | (iii) $3 \times 3 \times 3$ | 01 | |
| | 27 | 01 | 02 |
| | | | 04 |
| | (b) (i) $2^6$ | | 02 |
| | (ii) $4^3$ | | 02 |
| | | | 04 |
| | (c) (i) $<$ | 01 | |
| | (ii) $>$ | 01 | |
| | (iii) $=$ | 01 | 03 |
| | | | 03 |
| | | | **11** |
| 06. | (a) (i) 9, 18, 27, 36, 45 | | 03 |
| | (ii) 45 | | 01 |
| | (iii) 36, 45 | | 02 |
| | | | 06 |
| | (b) a ත්‍රැපීසියම | 01 | |
| | b සමචතුරස්‍රය | 01 | |
| | c සෘජුකෝණාස්‍රය | 01 | |
| | d සමාන්තරාස්‍රය | 01 | |
| | e ත්‍රිකෝණය | 01 | |
| | | | 05 |
| | | | **11** |

| | | | |
|---|---|---|---|
| 07. | (a) (i) $\frac{1}{3}, \frac{1}{8}, \frac{1}{7}, \frac{1}{5}$ | | 02 |
| | (ii) $\frac{5}{8}, \frac{5}{6}, \frac{3}{4}, \frac{1}{3}, \frac{1}{8}, \frac{1}{5}, \frac{1}{7}$ | | 02 |
| | | | 04 |
| | (b) (i) $<$ | 01 | |
| | (ii) $>$ | 01 | 02 |
| | | | 02 |
| | (c) (i) $\frac{3}{5}$ | | 01 |
| | (ii) $\frac{3 \times 2}{7 \times 2} + \frac{1}{14}$ | | |
| | $\frac{6}{14} + \frac{1}{14} = \frac{7}{14}$ | 01 | |
| | $= \frac{1}{2}$ | 01 | 02 |
| | | | 03 |
| | (iii) $\frac{7}{8} - \frac{1 \times 4}{2 \times 4}$ | 01 | |
| | $\frac{7}{8} - \frac{4}{8} = \frac{3}{8}$ | 01 | 02 |
| | | | 02 |
| | | | 11 |

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය
## Third Term Test - Grade 06

නම/විභාග අංකය : ........................................... ගණිතය කාලය: පැය 02 යි.

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

(1) වෘත්තාකාර හැඩ යටින් ඉරක් අඳින්න.

බිත්තරය, මුදුව, වළල්ල, දොඩම් ගෙඩිය


(2) 3 628 075 යන සංඛ්‍යාංකය වචනයෙන් ලියන්න.

..........................................................................................................................................................................

(3) (-5) සහ 3 යන සංඛ්‍යා සුදුසු පරිදි යොදාගෙන හිස්තැන් පුරවන්න.

........................... < ..............................

(4) දී ඇති රූපයේ දක්නට ලැබෙන කෝණ වර්ග දෙකක් ලියන්න.



..................................................... .....................................................

(5) ආසන්න 10 ට වටයන්න.

(i) 43 .................................... (ii) 75 ......................................

(6) 3055g යන ස්කන්ධය කිලෝග්‍රෑම් හා ග්‍රෑම්වලින් දක්වන්න.

...................................................................

(7) සුළු කරන්න. $\frac{7}{11} - \frac{3}{11}$


...............................................................................

(8) 10 ට අඩු සියළු ම ප්‍රථමක සංඛ්‍යාවල එකතුව කීය ද?

...............................................................................................................

(9) $2^5$ සහ $5^2$ න් වඩා විශාල කුමක් ද?

(10) සනකයක් සෑදිය හැකි පතොරොම තෝරා යටින් ඉරක් අඳින්න.



(11) $\frac{2}{3} = \frac{6}{\square} = \frac{\square}{15}$ තුල්‍ය භාග ලැබෙන සේ හිස් කොටු පුරවන්න.


(12) ළමයෙක් උතුරු දිශාවට මීටර 10 ක් ගොස් එතැන් සිට බටහිර දිශාවට මීටර 10 ක් ගොස් නැවතුනේ ය. දැන් ඔහුට ආරම්භක ස්ථානය පෙනෙන්නේ කුමන දිශාවෙන් ද?

..........................................................................................................................

(13) 4, 5, 6 යන සංඛ්‍යා තුනෙන් ම බෙදෙන කුඩාම සංඛ්‍යාව කුමක් ද?

..........................................................................................................................

(14) දී ඇති රූපයේ $\frac{3}{8}$ ක් අඳුරු කරන්න.




(15) ඇපල් ගෙඩි 5 ක මිල රු. 150 ක් නම් ඇපල් ගෙඩි 3 ක මිල සොයන්න.


..........................................................................................................................................................................................

(16) 1, 3, 6 ................. ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.


..........................................................................................................

(17) පහත නිරූපණය කර ඇති සංඛ්‍යා රටාවේ 3 වන හා 5 වන අවස්ථා ඇඳ දක්වන්න.





..........................................



..........................................

(18) ඇමරිකන් ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 182 කි. ඇමරිකන් ඩොලර් 50 ක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් කීයද?

..........................................................................................................................................................................................

(19) 18.3 - 6.85 හි අගය සොයන්න.

..........................................................................................................................................................................................

(20) 3846, 8451, 6453, 7278, 6167 යන සංඛ්‍යා අතුරින් 2 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

..........................................................................................................................................................................................

# II කොටස

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
  **(පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමි වේ)**

(1) (a) මිනිසෙක් තම ඉඩමේ වූ පොල් ගස් 30 කින් කඩන ලද ගෙඩි ගණන පහත ආකාරයට සටහන් කරගෙන තිබුණි.

6, 6, 7, 6, 8, 8, 9, 7, 10, 9, 7, 8, 6, 9, 7, 8, 8, 10
6, 10, 9, 7, 10, 8, 9, 8, 10, 9, 7

| ගසකින් කැඩූ පොල් ගෙඩි ගණන | ප්‍රගණන ලකුණු | ගස් ගණන |
|---|---|---|
| 6 | | |
| 7 | 卌 / | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

(i) වගුව පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න.


(ii) මෙහි ගසකින් කඩන ලද වැඩිම ගෙඩි සංඛ්‍යාව කීය ද?

(iii) මෙම ඉඩමේ වැඩි ගස් ප්‍රමාණයක කඩා ඇත්තේ ගෙඩි කීය බැගින් ද?

(b)

| පළතුරු වර්ගය | අලෙවි වූ ගෙඩි ගණන |
|---|---|
| දොඩම් | 16 |
| පේර | 10 |
| අඹ | 21 |
| දිවුල් | 36 |
| ඇපල් | 15 |

පළතුරු වෙළඳසැලකින් එක්තරා දිනක අලෙවි වූ පළතුරු ප්‍රමාණ පිළිබඳ තොරතුරු ඉහත වගුවේ දැක්වේ. පළතුරු ගෙඩි 4 ක් නිරූපනය කිරීමට ◯ සංකේතය යොදා ගනිමින් ඉහත දත්ත සඳහා චිත්‍ර ප්‍රස්තාරයක් අඳින්න.




(c) දුරකථන අලෙවි සැලකින් මාස 6 ක් තුල අලෙවි කරන ලද දුරකථන සංඛ්‍යා පිළිබඳ තොරතුරු ඉහත චිත්‍ර ප්‍රස්තාරයෙන් දැක්වේ.

(i) ජූලි මස අලෙවි කරන ලද දුරකථන සංඛ්‍යාව 72 ක් නම් ● සංකේතයෙන් දුරකථන කීයක් නිරූපණයවේද?

(ii) සැප්තැම්බර් මාසයේ අලෙවි වූ දුරකථන සංඛ්‍යාව කීයද?

(iii) මෙම මාස 6 තුල අලෙවි වූ මුළු දුරකථන සංඛ්‍යාව කීය ද?

(2) (a) තැඹිලි ගෙඩියක මිල $x$ වේ.

(i) තැඹිලි ගෙඩියක මිල රු. 10 කින් ඉහළ ගිය විට තැඹිලි ගෙඩියක නව මිල $x$ ඇසුරින් ලියන්න.

(ii) මිල ඉහළ යාමට පෙර තැඹිලි ගෙඩියක් මිලදී ගැනීමට රු. 100 ක් දුන් අයෙකුට ලැබෙන ඉතිරි මුදල $x$ ඇසුරින් ලියන්න.

(iii) $x = 50$ නම් මිල ඉහළ යාමට පෙර සහ මිල ඉහළ යාමට පසු රු. 300 කට මිල දී ගත හැකි තැඹිලි ගෙඩි ප්‍රමාණ වෙන වෙන ම සොයන්න.

(b) අක්කාගේ සහ මල්ලී ගේ දෛනික වියදම රුපියල් $p + 120$ වේ. මෙහි 120 අක්කාගේ දෛනික වියදමයි.

(i) ඉහත $p$ මගින් දැක්වෙන්නේ කාගේ දෛනික වියදම ද?

(ii) සෙනසුරාදා මල්ලීගේ වියදම රු. 70 නම් එදින දෙදෙනාගේ මුළු වියදම කීයද?

(iii) ඉරිදා දින දෙදෙනාගේ මුළු වියදම රු. 200 නම් $p$ හි අගය නියතයක් ද? විචල්‍යයක් ද?

(3) පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා පැමිණෙන අයට සංග්‍රහ කිරීම සඳහා පළතුරු බීම සාදනු ලැබේ. මේ සඳහා ලීටර දෙකේ පළතුරු යුෂ බෝතල් 3 ක් සහ දෙහි යුෂ මිලිලීටර 500 ක් ජලය ලීටර 17 ක මිශ්‍ර කෙරේ.

(i) යොදාගත් මුළු පළතුරු යුෂ ප්‍රමාණය මිලිලීටර කීය ද?

(ii) මිශ්‍ර කළ පළතුරු යුෂ ප්‍රමාණය සහ දෙහි යුෂ ප්‍රමාණය අතර අනුපාතය සොයා එය සරල ම ආකාරයෙන් දක්වන්න.

(iii) මිශ්‍රණයේ මුළු බීම ප්‍රමාණය ලීටර හා මිලිලීටර වලින් දක්වන්න.

(iv) එක් අයෙකුට මිලිලීටර 150 බැගින් 155 දෙනෙකුට සංග්‍රහ කිරීමට මෙම බීම ප්‍රමාණය සෑහේ දැයි සොයන්න.

(4) (i) $5 \times 5 \times 5$ දර්ශක ආකාරයෙන් ලියන්න.


(ii) $3^5$ හි පාදය කුමක් ද? දර්ශකය කුමක් ද?

(iii) 64 දෙකෙහි බලයක් ලෙස ලියන්න.


(iv) 64 වෙනත් පාදයක බලයක් ලෙස ලියන්න.

(v) $2^3 \times 3^2$ හි අගය සොයන්න.

(5) (a)




දී ඇති මිනුම් අනුව මෙම තහඩු කැබැල්ලේ පරිමිතිය සොයන්න.




(b) කොටු දැල මත ඇති රූපයේ වර්ගඵලය සොයන්න. කුඩා කොටුවක වර්ගඵලය $1cm^2$ වේ.

(c) භාජනයක ජලය 15$\ell$ 750$m\ell$ ක් තිබේ.

(i) මෙම භාජනයට ජලය 7$\ell$ 300$m\ell$ දැමූ පසු මුළු ජල ප්‍රමාණය කොපමණ ද?


(ii) දැන් භාජනයෙන් ජලය 18$\ell$ 550$m\ell$ ඉවත් කළේ නම් භාජනයේ කොපමණ ජල ප්‍රමාණයක් ඉතිරිවේ ද?

(6) (a) මෙම රූපයේ හඳුනාගත හැකි චතුරස්‍ර වර්ග 4 ක් ලියන්න.



(b) තරාදියක් මත සිටින උදාරි ගේ ස්කන්ධය *23kg 550g* ලෙස සටහන් විය. හදිසියේ ම ඇගේ මල්ලී දිව විත් තරාදියට ගොඩ විය. එවිට තරාදියේ පාඨාංකය 35kg 375g ලෙස දැක්විය. උදාරිගේ මල්ලීගේ ස්කන්ධය සොයන්න.

(c) මෙහි දැක්වෙන පතොරොමෙන් සෑදිය හැකි ඝන වස්තුවේ,



(i) නම කුමක් ද?
(ii) මුහුණත් කීය ද?
(iii) දාර කීයද?
(iv) ශීර්ෂ කීය ද?

(7)

| ද්‍රව්‍ය | මිල රු. |
|---|---|
| වඩේ 1 | 5.00 |
| ආප්ප 1 | 12.00 |
| අයිස් පැකට් 1 | 10.00 |
| රෝල්ස් 1 | 20.00 |
| හැලප 1 | 15.00 |

මෙහි දැක්වෙන්නේ ආපන ශාලාවක ප්‍රදර්ශනය කර තිබූ මිල දර්ශනයකි. මිතුරන් තිදෙනෙක් මෙම ආපන ශාලාවට පැමිණ වඩේ 5ක්, ආප්ප 3 ක් සහ අයිස් පැකට් 4 ක් මිලදී ගැනීමට සූදානම් විය.

(i) මිල දර්ශනය අනුව මේ සඳහා වන මුළු වියදම සොයන්න.
(ii) ඔවුන් තිදෙනාම ළඟ තිබුණේ රුපියල් 96 ක් පමණක් නම් ඉහත මුදල ගෙවීම සඳහා හිඟවන මුදල කොපමණද?
(iii) පසුව තිදෙනා සමසේ බෙදා ගත හැකිවන ලෙසත් වියදම රු. 96 වන ලෙසත් ඔවුන් ද්‍රව්‍ය වර්ග තුනක් තෝරාගන්නා ලදී. ඔවුන් මිලදී ගැනීමට තෝරාගත් ද්‍රව්‍ය සහ ඒවායේ ප්‍රමාණ සොයන්න.

Answer

# Grade 6 Maths 3rd term Online Class Paper No - 05



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education**



තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය
**Third Term Test - Grade 06**

නම/විහාග අංකය : ........................................ ගණිතය කාලය: පැය 02 යි.

## I කොටස

| | | | |
|---|---|---|---|
| (1) | මුදුව | 01 | |
| | වළල්ල | 01 | 02 |
| (2) | තුන් මිලියන හයසිහ | | |
| | විසි අට දහස් හැත්තෑපහ | | 02 |
| (3) | (5) < 3 | | 02 |
| (4) | මහාකෝණ | 01 | |
| | පරාවර්තකෝණ | 01 | 02 |
| (5) | (i) 40 | 01 | |
| | (ii) 80 | 01 | |
| (6) | 3kg 55g | | 02 |
| (7) | $\frac{4}{11}$ | | 02 |
| (8) | 17 | | |
| (9) | 2 x 2 x 2 x 2 x 2 හෝ 5 x 5 | 01 | |
| | $2^5$ | 02 | |
| (10) |  | | 02 |
| (11) | 9, 10 | | |
| (12) |  ගිණිකොන | | 02 |
| (13) | 60 | | 02 |



| | | | |
|---|---|---|---|
| (14) | නිවැරදි පිළිතුරට | | 02 |
| (15) | 1ක් $\frac{150}{5} = 30$ | | |
| | 3 x 30 | | 02 |
| (16) | 10 | 01 | |
| | 15 | 01 | 02 |
| (17) |  | 01 | |
| |  | 01 | 02 |
| (18) | 182 x 50 | 01 | |
| | 9100 | 01 | 02 |
| (19) | 18.3<br>6.85<br>11.45 | | 02 |
| (20) | 3846 | 01 | |
| | 7278 | 01 | 02 |

# II කොටස

| | | | | |
|---|---|---|---|---|
| (1) | (a) (i) ප්‍රගණන තීරය | 02 | | |
| | සංඛ්‍යාතය | 02 | | |
| | (ii) 10 | 01 | | |
| | (iii) 8 | 01 | 06 | |
| | (b) 1ක් නිවැරදිව දැක්වීමට | 01 | | |
| | 2ක් නිවැරදිව දැක්වීමට | 02 | | |
| | 3ක් නිවැරදිව දැක්වීමට | 03 | | |
| | 4ක් නිවැරදිව දැක්වීමට | 04 | 04 | |
| | (c) (i) 12 | 02 | | |
| | (ii) 54 | 02 | | |
| | (iii) 414 | 02 | 06 | 16 |
| (2) | (a) (i) x + 10 | 02 | | |
| | (ii) 100 - x | 02 | | |
| | (iii) 300/50 = 6 | 01 | | |
| | 300/60 = 5 | 01 | 06 | |
| | (b) (i) මල්ලීගේ | 01 | | |
| | (ii) රු. 190.00 | 02 | | |
| | (iii) විචල්‍යයක් | 02 | 05 | 11 |
| (3) | (i) 6000ml | 02 | | |
| | 6000:500 | 02 | | |
| | 12:1 | 01 | 03 | |
| | (ii) 6*l* + 500*ml* + 17*l* | 02 | | |
| | 23*l* 500*ml* | 01 | 03 | |
| | (iii) 155x 150ml = 23250ml | | | |
| | 23500ml | 02 | | |
| | සැහේ | 01 | 03 | 11 |

| | | | | |
|---|---|---|---|---|
| (4) | (i) $5^3$ | 02 | 02 | |
| | (ii) 3 | 01 | | |
| | 5 | 01 | 02 | |
| | (iii) $2^6$ | 03 | 03 | |
| | (iv) $4^3$ හෝ $8^2$ | 02 | 02 | |
| | (v) 2 x 2 x 2 x 3 x3 | 01 | | |
| | 72 | 01 | 02 | 11 |
| (5) | (a) 27m 33cm | 04 | | |
| | (b) $23cm^2$ | 03 | | |
| | (c) (i) 23*l* 50*ml* | 02 | | |
| | (ii) 4*l* 500*ml* | 02 | | 11 |
| (6) | (a) සමචතුරස්‍රය | 01 | | |
| | සෘජුකෝණාස්‍රය | 01 | | |
| | සමාන්තරාස්‍රය | 01 | | |
| | ත්‍රපීසියම | 01 | 04 | |
| | (b) 35kg 375g - 23kg 550g | 02 | | |
| | 11kg 825g | 01 | 03 | |
| | (c) (i) චතුස්තලය | 01 | | |
| | (ii) 4 | 01 | | |
| | (iii) 6 | 01 | | |
| | (iv) 4 | 01 | 04 | 11 |
| (7) | (i) (5 x 5) + (12 x3) + (10 x 4) | 03 | | |
| | රු. 101.00 | 02 | 05 | |
| | (ii) 101.00 96.00 | 03 | | |
| | රු. 5.00 | 02 | 05 | |
| | (iii) සුදුසු පිළිතුරකට | 04 | 04 | 11 |